# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.10.08 පැය 0615 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1861/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.**

**01. හුංගම ප්‍රදේශයේදී සිදුවූ ද්විත්ව මනුෂ්‍ය ඝාතනයකට සම්බන්ධ සැකකරුවන් තිදෙනෙකු හා ආධාර අනුබල දුන් සැකකාරියක් අත්අඩංගුවට - තංගල්ල කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2025.10.07 වන දින අළුයම් කාලයේ හුංගම පොලිස් වසමේ වාඩිගල, රන්න ප්‍රදේශයේ නිවසක් තුල පිරිමි පුද්ගලයෙකු හා කාන්තාවක් කපා කොටා ඝාතනය කිරීමේ අපරාධය සම්බන්ධව හුංගම පොලිස් ස්ථානය හා තංගල්ල කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය මඟින් වැඩිදුර විමර්ශන ආරම්භ තිබුණි.

ඒ අනුව 2025.10.07 වන දින උදෑසන හා සවස් කාලයේදී හුංගම පොලිස් වසමේ අඳුපැලැන හා රන්න ප්‍රදේශවලදී එම කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත මෙම අපරාධයට සම්බන්ධ සැකකරුවන් තිදෙනෙකු සහ අපරාධයට ආධාර අනුබල දීම යටතේ සැකකාරියක් අත්අඩංගුවට ගෙන හුංගම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකරුවන් අවුරුදු 27 හා 33 වයස් වල පසුවන රන්න ප්‍රදේශයේ පදිංචිකරුවන් වන අතර සැකකාරිය වයස අවුරුදු 35 ක් වන එම ප්‍රදේශයේම පදිංචිකාරියකි.**

මෙම අපරාධයට සම්බන්ධ තවත් සැකකරුවන් අත්අඩංගුවට ගැනීමට තවදුරටත් විමර්ශන සිදුකරනු ලබන අතර අපරාධයට යොදා ගත් මෙරට නිෂ්පාදිත බෝර 12 වර්ගයේ පතරොම් යෙදිය හැකි ගල්කටස් වර්ගයේ ගිනි අවියක්, මන්නා පිහි 02 ක්, බෝර 12 වර්ගයේ සජීව පතරොමක් හා බෝර 12 වර්ගයේ හිස් පතරොමක් පොලිස් භාරයට ගෙන ඇත.

හුංගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. ටී 56 වර්ගයේ පතරොම් 20 ක් හා අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 03 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - රත්නපුර කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2025.10.07 වන දින දහවල් කාලයේ පැල්මඩුල්ල පොලිස් වසමේ පාතකඩ ප්‍රදේශයේදී රත්නපුර කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමකට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර ටී 56 වර්ගයේ ජීව පතරොම්

20 ක් හා අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 03 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන රත්නපුර පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 20 ක් වන පාතකඩ, පැල්මඩුල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම සැකකරු දැනට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් අත්අඩංගුවට ගෙන ඇති සැකකරුවෙකුගෙන් අත්අඩංගුවට ගැනීමට පෙර මෙම පතරොම් තොගය ලබාගෙන ඇති බවට විමර්ශනයේදී අනාවරණය වී ඇත. රත්නපුර කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 03. අකුණු සැර වැදී පුද්ගලයෙකු මියයාමක් - බේරුවල පොලිස් වසම.

2025.10.07 වන දින අළුයම් කාලයේ බේරුවල පොලිස් වසමේ මග්ගොන දියලගොඩ ප්‍රදේශයෙන් එක්දින ධීවර යාත්‍රාවකින් ධීවර කටයුතු සඳහා දියඹට ගිය පුද්ගලයින් දෙදෙනෙකුට අකුණු සැර වැදී ඇත.

අකුණුසැර වැදුනු පුද්ගලයින් අසල වෙනත් බෝට්ටුවක සිටි පිරිසක් විසින් අකුණු සැර වැදුණු පුද්ගලයින් දෙදෙනා ගොඩබිමට රැගෙනවිත් බේරුවල රෝහලට ඇතුලත් කිරීමේදී එක් පුද්ගලයෙකු මියගොස් ඇති බවට බේරුවල පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 44 ක් වූ ගොඩැල්ලවත්ත, මග්ගොන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කළුතර නාගොඩ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර බේරුවල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. සැකකටයුතු මරණයක් - පෑලියගොඩ පොලිස් වසම.

2025.10.07 වන දින සවස් කාලයේ පෑලියගොඩ පොලිස් වසමේ කොළඹ බියගම ප්‍රධාන මාර්ගයේ කළුපාලම ප්‍රදේශයේදී මාර්ගය අයිනේ පුද්ගලයෙකු තුවාල සහිතව වැටී සිටියදී 1990 ගිලන් රථ සේවාවෙන් කොළඹ ජාතික රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇති බවට පෑලියගොඩ පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරුගේ අනන්‍යතාවය මෙතෙක් තහවුරු වී නොමැත.**

මෘත ශරීරය කොළඹ ජාතික රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර මෙය මනුෂ්‍ය ඝාතනයක්ද නැතහොත් රිය අනතුරකින් සිදුවූ මරණයක්ද යන්න පිළිබඳව පෑලියගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. මාරක රිය අනතුරක් - බුලත්සිංහල පොලිස් වසම.

2025.10.07 වන දින සවස් කාලයේ බුලත්සිංහල පොලිස් වසමේ හොරණ මතුගම ප්‍රධාන මාර්ගයේ බුලත්සිංහල නගරයේදී මතුගම දෙස සිට බුලත්සිංහල දෙසට ධාවනය වූ යතුරුපැදියක් පදික මාරුව මතින් ගමන් කරමින් සිටි පදික පුද්ගලයෙකුගේ ගැටී යතුරුපැදිය මාර්ගයේ පෙරලී ගොස් අනතුරක් සිදුව ඇත. අනතුරින් පැදිකරු හා පදිකයා තුවාල ලබා බුලත්සිංහල රෝහලට ඇතුලත් කිරීමේදී

පැදිකරු මියගොස් ඇත. පදිකයා වැඩිදුර ප්‍රතිකාර සඳහා හොරණ රෝහලට මාරු කර යවා ඇත.

**මරණකරු වයස අවුරුදු 18 ක් වූ දෙල්ගස්මූකලාන, බුලත්සිංහල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය බුලත්සිංහල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර බුලත්සිංහල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**